රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99(XL)

මගේ අංකය : EST-6/05/TPR/3047(i)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2024.04.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හා ඊට ආනුෂංගිකව නිකුත් කර ඇති චක්‍රලේඛ වෙත අවධානය යොමු කරවමි.

02. 2022.01.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022 මඟින් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීමත්, පසුව 2022.09.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022 මඟින් අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීමත් අතර කාලය තුළ, වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසුව විශ්‍රාම ගිය පහත චක්‍රලේඛ අනුව අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන නිලධරයන්ට තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා දීමට 2024.03.11 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

I. 2011.06.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XVIII)
II. 2014.11.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXX)
III. 2015.10.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXXI)
IV. 2019.12.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXXVII)

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk